# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2032/38 - 2017 අගෝස්තු මස 18 වැනි සිකුරාදා - 2017.08.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 3/කටා/ඉ.අත්/91.
*ඉඩම් අමාත්‍යාංශ යොමුව* : 4-3/2/2015/AV/205.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර*:

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිඹුලපිටිය ගමේ පිහිටි ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියම් අංක 511211 දරන පිඹුරේ කැබලි අංක 272 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3284 ක් විශාල දෙල්ගහවත්ත *නොහොත්* මිල්ලගහවත්ත නැමති ඉඩම.

**කැබලි අංකය 405**
ඉඩමේ නම: දෙල්ගහවත්ත *නොහොත්* මිල්ලගහවත්ත; විස්තරය : ගෙවත්ත, අවුරුදු 15-25 පමණ වයසැති පොල්ගස් 38ක් ඇත; හිමිකම් කියන අය: එන්. ඩබ්ලිව්. කමලා රංජනී, අංක 73, රංග, තලාදූව පාර, මීගමුව; ප්‍රමාණය: හෙක්. 0.3284.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 08 වැනි දින පෙ. ව. 09.30 ට කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2017 අගෝස්තු මස 17 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 1124

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නිවැරදි කිරීමයි

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

2017.01.10 වැනි දින පළවූ අංක 2001/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොරදෙණිය, හේනේපොල, දෙවටේගෙදර සහ කෙසෙල්වත්තේහේන ගම්වල පිහිටි අ.ග.පි. 2332 හි KU/PLG/2016/512 අංකය යටතේ වූ කැබලි අංක 1 පහත සඳහන් ලෙස සංශෝධනය විය යුතු ය.

**කැබලි අංක 114**

ඉඩමේ නම: වදුරන්කන්ද; විස්තරය : ලඳු කැළය සහිත වත්ත සහ ගල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. එම්. දේවිකා අතපත්තු, ඒ. එම්. එන්. කේ. අතපත්තු, ඒ. එම්. ඩී. දීපානි අතපත්තු, ඒ. ඒ. පුෂ්පා දමයන්ති, ඒ. එම්. තිස්ස කුමාර, ඒ. එම්. ප්‍රදීප් සංජීව අතපත්තු, එන්. එම්. පොඩිමැණිකේ, ඒ. එම්. තක්ෂිලා ශිරාණි අතපත්තු සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.4742.

**කැබලි අංකෙ 115**

ඉඩමේ නම: වදුරන්කන්ද; විස්තරය : ගල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. එම්. එන්. කේ. අතපත්තු, ඒ. එම්. ඩී. දීපානි අතපත්තු; ප්‍රමාණය: හෙක්. 0.1691.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

08 - 1125

## නිවැරදි කිරීමයි

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

2016.10.07 වැනි දින පළවූ අංක 1987/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹුගොඩ සහ කළුගොමුව ගම්වල පිහිටි මු.පි.අ.කු. 2335, අතිරේක අංක 1, පත්‍ර අංක 1 හි KU/ PLG/2016/513 අංකය යටතේ වූ කැබලි අංක 36 සහ 37 පහත සඳහන් ලෙස සංශෝධනය විය යුතු ය.

**කැබලි අංක 57**

ඉඩමේ නම: මහගමවත්ත; විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: රත්නායක මුදියන්සේලාගේ ප්‍රේමාවතී; ප්‍රමාණය: හෙක්. 0.0778.

**කැබලි අංක 58**

ඉඩමේ නම: මහගමවත්ත; විස්තරය : ගල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සිල්පාධිපතියලාගේ සියනේරිස්; ප්‍රමාණය: හෙක්. 0.0290.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

08 - 1126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.